සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## යුරෝපා ඉතිහාසය

13 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය


### I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(3) | 3 -(3) | 4 -(4) | 5 -(3) | 6 -(2) | 7 -(1) | 8 -(1) | 9 -(3) | 10 -(1) |
| 11 -(2) | 12 -(1) | 13 -(0) | 14 -(5) | 15 -(5) | 16 -(1) | 17 -(4) | 18 -(2) | 19 -(3) | 20 -(3) |
| 21 -(1) | 22 -(2) | 23 -(4) | 24 -(1) | 25 -(3) | 26 -(3) | 27 -(1) | 28 -(4) | 29 -(1) | 30 -(4) |
| 31 -(3) | 32 -(4) | 33 -(2) | 34 -(3) | 35 -(1) | 36 -(1) | 37 -(4) | 38 -(5) | 39 -(2) | 40 -(3) |

### II කොටස

II කොටස

(01)



නිවැරදිව සිතියමේ ස්ථාන ලකුණු කර ඇත්නම් ලකුණු 8. කෙටි සටහන් දෙකට ලකුණු 10 ක් බැගින් 18 ක් වේ.

(02) (1)
- නව මුහුදු මාර්ග සොයා පෙරදිගට ඒමට ඇති වූ උනන්දුව මත යුරෝපීය ජාතිකයෝ දේශගවේෂණයට යොමු වීම.
- කොන්ස්තන්තිනෝපලය මුස්ලිම්වරු අතට පත්වීමත් සමග ගවේෂණ කටයුතු සඳහා අවහිර වීම.
- ගවේෂණ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය හා මධ්‍යම පාන්තිකයින්ගේ අනුග්‍රහ ලැබුණි.
- රටවල් අතර තරගයක් දේශගවේෂණයට ඇතිවිය.
- කීර්තිය ලැබීමේ අවශ්‍යතාවය ඇති වුණා.
- පෘතුගාලය, ස්පාඤ්ඤය ප්‍රමුඛ විය.

(2)
- ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා මහද්වීප වල යුරෝපීය යටත් විජිත ඇති විය.
- නව වෙළඳ නගර ඇති විය.

- කාර්මික විප්ලවයට අමුද්‍රව්‍ය, වෙළඳපොල සොයා ගැනුණි.
- ක්‍රිස්තියානි ධර්මය යටත් විජිත වල ව්‍යාප්ත විය.
- යුරෝපා සංස්කෘතිය / තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත විය.
- වෙළඳ භාණ්ඩ පෙරදිග සිට අපෙරදිගට එකතු විය.
- නව විදේශ සබඳතා ඇති විය.

(03) (1) ප්‍රංශයේ සමාජය ප්‍රධාන ප්‍රජා ගුණ තුනක් විය.

1. රජු හා පූජකයින්
2. රදළයින්
3. සාමාන්‍ය ජනයා, මධ්‍යම පන්තිය, ගොවීන් හා නාගරික ශ්‍රමිකයින්.

තෙවන සමාජ පන්තියට එල්ල වුණු අසීමිත බදු බර, අසාධාරණ පාලන ක්‍රමය ආදිය මෙන්ම ගොවීන්ට තිබුණු අපහසුතාවය ආදිය මඟින් විප්ලවයට මඟ පෑදුණි.

(2)
- මධ්‍යම පාන්තිකයින්ට වෙළඳ කටයුතු, රැකියා මෙන්ම ප්‍රතිලාභ ලැබීම.
- මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයත් සමඟ අයිතිවාසිකම් ලැබීම.
- නිදහස, සමානාත්මතාවය හා සහෝදරත්වය යන පාඨය මඟින් ඇරඹි විප්ලවය මත ජනතාවගේ අභිමතාර්ථ ඉටු වීම.
- අභ්‍යන්තර තීරු බදු, ශ්‍රේණි අහෝසි කිරීම.
- දේව වරම් වාදය අභියෝගයට ලක්වීම.
- මධ්‍යම පන්තිය විශාල ප්‍රතිලාභ ලබා ගනී.

(04) (1)
- එංගලන්තයේ තිබූ ආර්ථික, සමාජීය පසුබිමේ ස්වභාවය, සම්පත් බහුල වීම.
- ශ්‍රමයට බහුල වීම.
- ශ්‍රමයට පිරිස් සිටීම.
- තාක්ෂණික අතින් තිබූ දියුණුව

(2)
- සුළු කර්මාන්ත බිඳ වැටී මහා පරිමාණ වෙළඳාම්, කාර්මික ක්‍රම ඇරඹීම.
- ධනවාදී ආර්ථික ක්‍රම
- ධනපති හා නිර්ධන පන්ති අතර අරගල.
- පරිසර දූෂණය.
- වැටුප් ලබන කම්කරු පන්තිය.
- වෘත්තීය සංගම් බිහි වීම.
- නව අධිරාජ්‍යවාදයට මඟ පෑදීම.
- නාගරීකරණය.
- කාර්මික නගර ඇතිවීම.
- ප්‍රබල මධ්‍යම පන්තිය

(05) (1)
- ජර්මනියේ ආරම්භ විය.
- මාටින් ලූතර්, ජෝන්, කැල්වින්, උල්රිච් ස්විංග්ලි නායකත්වය දෙනු ලැබුවා.
- කතෝලික පල්ලියේ දූෂණ.
- පාප් ධූරයට වූ ගෞරවය පිරිහීම.
- ධනය උපයා ගැනීමට පල්ලිය අනුගමනය කළ උපක්‍රම වලට විරෝධය පල කිරීම.

(2)
- එක්සත් ක්‍රිස්තු සභාව බිඳ වැටුණි.
- යුරෝපය ආගමික වශයෙන් දෙකඩ වීම.
- පාප් තුමාගේ බලය පිරිහීම.
- ශුද්ධ රෝම අධිරාජයා දුර්වල වීම.
- ආගමික නායකත්වය රාජ්‍ය පාලනයට යටත් වීම.
- විවිධ කතෝලික නිකායන් බිහිවීම.
- ආගමික යුද්ධ වලට මඟ පෑදීම.
- ප්‍රතිරෙපරමාදුව ඇති වීම.
- මිෂනාරී ව්‍යාපාරය